කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

---

No SF-2022-04-T

## වර්ෂ 2022 අප්‍රේල් සිට ජුනි දක්වා උෂ්ණත්වය පිළිබඳ අනාවැකිය

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඍතුමය අනාවැකිකරන අංශය මගින් 2022 අප්‍රේල් 04 වන දින නිකුත් කරන ලදී.**

---

## 1. <u>2022 අප්‍රේල් මාසය සඳහා උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය</u>

2022 අප්‍රේල් මාසය සඳහා ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය පහත දැක්වෙන පරිදි වේ.






රූපය **01:** උපරිම උෂ්ණත්වය (දහවල් කාලයේ )   රූපය **02:** අවම උෂ්ණත්වය( රාත්‍රී කාලයේ)

රූපය 01: හි 2022 අප්‍රේල් මාසය තුළ ශ්‍රී ලංකාවේ උපරිම උෂ්ණත්වය (දහවල් කාලයේ ) සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. ඒ අනුව, 2022 අප්‍රේල් මාසයේදී මන්නාරම, වව්නියාව, අනුරාධපුරය, පුත්තලම, කුරුණෑගල, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, කොළඹ, ගම්පහ, ගාල්ල, රත්නපුර, හම්බන්තොට, මහනුවර, නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වල උපරිම උෂ්ණත්වය(දහවල් කාලයේ) සාමාන්‍යයට වඩා මඳක් උෂ්ණත්වය පහල යාමේ හැකියාවක් පවතී.

රූපය 02: හි 2022 අප්‍රේල් මාසය තුළ ශ්‍රී ලංකාවේ අවම උෂ්ණත්වය ( රාත්‍රී කාලයේ) සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. ඒ අනුව, 2022 අප්‍රේල් මාසය සඳහා කොළඹ, ගම්පහ, ගාල්ල, රත්නපුරය, හම්බන්තොට, වව්නියාව, අනුරාධපුරය, මහනුවර, නුවරඑළිය, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර යන

දිස්ත්‍රික්ක වල අවම උෂ්ණත්වය සාමාන්‍යයට වඩා මඳක් ඉහල යාමේ හැකියාවක් ඇති අතර මන්නාරම, පුත්තලම, කුරුණෑගල සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වල අවම උෂ්ණත්වය සාමාන්‍යයට වඩා පහල යාමේ හැකියාවක්ද පවතී.

## 2. 2022 අප්‍රේල්-ජුනි දක්වා උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය

2022 අප්‍රේල් සිට ජුනි දක්වා කාලය සඳහා ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය පිළිබඳ සම්භාවිතා පුරෝකථනය පහත දැක්වෙන පරිදි වේ.






රූපය **03:** උපරිම උෂ්ණත්වය (දහවල් කාලයේ ) රූපය **04:** අවම උෂ්ණත්වය( රාත්‍රී කාලයේ)

රූපය 03: හි 2022 අප්‍රේල් සිට ජුනි දක්වා කාලය තුල ශ්‍රී ලංකාවේ උපරිම උෂ්ණත්වය සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. ඒ අනුව, 2022 අප්‍රේල් සිට ජුනි දක්වා කාලය තුල මන්නාරම, වව්නියාව, අනුරාධපුරය, පුත්තලම, කුරුණෑගල, කොළඹ, ගම්පහ, ගාල්ල, රත්නපුරය, හම්බන්තොට, අම්පාර, මඩකලපුව, මහනුවර, නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වල සාමාන්‍යය උපරිම උෂ්ණත්වයට වඩා මඳක් උෂ්ණත්වය ඉහල යාමේ හැකියාවක් ඇති අතර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සාමාන්‍යය උපරිම උෂ්ණත්වයට වඩා මදක් උෂ්ණත්වය පහල යාමේ හැකියාවක් පවතී.

රූපය 04: හි 2022 අප්‍රේල් සිට ජුනි දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ අවම උෂ්ණත්වය සඳහා සම්භාවිතා පුරෝකථනය දැක්වේ. ඒ අනුව, 2022 අප්‍රේල් සිට ජුනි දක්වා කාලය තුල වව්නියාව, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, කුරුණෑගල, ගාල්ල, රත්නපුර, මහනුවර සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වල අවම උෂ්ණත්වය සාමාන්‍යය අවම උෂ්ණත්වයට වඩා මඳක් පහල යාමේ හැකියාවක් ඇති අතර මන්නාරම, පුත්තලම, කොළඹ, ගම්පහ, නුවරඑළිය, හම්බන්තොට, අම්පාර සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වල අවම උෂ්ණත්වය සාමාන්‍යයට වඩා ඉහල යාමේ හැකියාවක් පවතී.

**සටහන: දිගුකාලීන දේශගුණික දත්ත නොමැති වීම හේතුවෙන් කෑගල්ල, මාතර, මාතලේ, මුලතිවු, කිලිනොච්චි, පොලොන්නරුව, මොනරාගල, යාපනය සහ කළුතර යන දිස්ත්‍රික්ක සඳහා උෂ්ණත්ව අනාවැකි මෙහි ඇතුළත් නොවේ.**